# අයදුම්පත පිරවීම සඳහා උපදෙස් ලේඛනය

**ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව**

**ඔබගේ අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර කරුණාකර මෙම උපදෙස් හොඳින් කියවන්න.**

**1. ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - (වසර 01) හැදෑරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් :**

1.1 අ.පො.ස (සා.පෙ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් 06ක් සම්මාන (c) සමාර්ථ තුනක් සහිතව **එකවර** සමත්වීම.

**සහ**

1.2 අවුරුදු 22ට නොඅඩු අයෙකු වීම.

ඉහත 1.1 දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසුව වසර දෙකක කාලයක්,

(i) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවක නිරත වූවෙකු වීම.

**හෝ**

(ii) ස්වයං රැකියාවක නිරතවූවෙකු වීම.

**සහ**

1.3 උක්ත පාඨමාලාව හැදෑරීම සඳහා අයදුම්කරුගේ යෝග්‍යතාවය පරීක්ෂණ කිරීම සඳහා මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වන **යෝග්‍යතා පරීක්ෂණයෙන්** සහ **සම්මුඛ පරීක්ෂණයෙන්** සමත්වීම අනිවාර්යය වේ.

**2. අයදුම්කරුවන්ගේ වයස හා වසර දෙකක සේවා කාලය නිර්ණය කරන ආකාරය.**

ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්කරන සෑම අයදුම්කරුවෙකුම **2024.03.04** දිනට වයස අවුරුදු 22ට නොඅඩු අයෙකු විය යුතු අතර එම දිනට වසර දෙකකට නොඅඩු රාජ්‍ය /පෞද්ගලික ආයතනයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ඔබ ස්වයං රැකියාවක නියුක්ත අයදුම්කරුවෙකු නම්, **2024.03.04** දිනට වසර දෙකකට පෙර තම ව්‍යාපාරය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර තිබිය යුතුය.

**3. තෝරාගැනීම**

3.1 ඉහත පාඨමාලාව සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති රැකියාධාරී අයදුම්කරුවන් **යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වූ පසුව සම්මුඛ පරීක්ෂණයක්** මගින් තෝරාගනු ලැබේ. පාඨමාලාව සඳහා තෝරාගැනීමේ සම්පූර්ණ වගකීම මානව සම්පත් අභිවර්ධන ආයතනය සතු වන අතර, අදාල සියලුම කරුණු පිළිබඳ අවසාන තීරණය ආයතනයේ කළමණාකරන මණ්ඩලය සතුවේ.

3.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2024.02.29** වන අතර එම දිනට ප්‍රථම අයදුම්කරුවන් විසින් තම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**4. දේශන පැවැත්වීම**

සතියේ දිනවල සඳුදා සිට සිකුරාදා දක්වා පස්වරු 05.00 සිට පස්වරු 07.30 (ඩිප්ලෝමා පාඨමාලාව පමණක්) දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේදී දේශන පැවැත්වේ.

විභාග සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් එක් එක් විෂය සඳහා පවත්වනු ලබන දේශන සඳහා **80%ක දේශන සහභාගීත්වය අනිවාර්ය වේ.**

**5. ලියාපදිංචි සහ පරිගණක විද්‍යාගාර ගාස්තු**

මෙම පාඨමාලාව හැදෑරිම සඳහා ඔබගේ පාඨමාලා ගාස්තුවෙන් වැඩි කොටසක් රජය විසින් දරන අතර **වාර්ෂිකව රු 9,000ක මුදලක් ලියාපදිංචි වීමේ ගාස්තුවක්** ලෙස අය කෙරේ.

## 6. අයදුම්පත Online ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙත

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්කිරීම www.ihra.cmb.ac.lk වෙබ් අඩවියට පිවිස මාර්ගගත **(online) ක්‍රමය හරහා පමණක් කළ යුතු** අතර එසේ අයදුම්කිරීමෙන් අනතුරුව ඔබගේ **විද්‍යුත් තැපැල වෙත ලැබෙන අයදුම්පත්‍රයේ පිටපත blm@ihra.cmb.ac.lk වෙත forward** කල **යුතුය. එමෙන්ම එම අයදුම්පත්‍රයේ පිටපතක් පහත ලිපිනයට ද තැපැල මඟින් යොමු කල යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපිකවරයේ වම් කෙළවර ඉහළ "ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව 2024/2025" ලෙස සටහන් කිරීම අනිවාර්ය වේ.**

මානව සම්පත් අභිවර්ධන ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය
අංක. 275, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07

6.1 **අයදුම්පත සමඟ scan කර උඩුගත (Upload) කළ යුතු ලිපිලේඛන වන්නේ,**

(i) සේවා ස්ථානයේ ප්‍රධානියාගෙන් ලබා ගත් සේවා කාලය සහ දැනට සේවයේ යෙදී සිටින බවට දැක්වෙන සේවා සහතිකය scan කර උඩුගත කරන්න.
(ii) ස්වයං රැකියාවල නියුක්ත වුවන් පහත සඳහන් ලේඛන scan කර අයදුම්පත සමග උඩුගත කළ යුතුය.

අ. ඔබගේ ව්‍යාපාරය **2024.03.04** දිනට වසර දෙකකට පෙර තමාගේ නමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇති බව තහවුරු කරන ලද ලේඛනය.

ආ. මේ දක්වා එය අඛණ්ඩව පවත්වාගෙන යන බවට සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව පළාතේ ග්‍රාමසේවා නිලධාරියාගෙන් ලබා ගත් සහතිකය.

6.2 පාඨමාලා අයදුම්පත් ගාස්තු වන රුපියල් දෙදහසක (රු.2,000.00) මුදල ගෙවූ රිසිට්පත scan කර උඩුගත කරන්න .

6.3 **විභාග දෙපාර්තමේන්තුවෙන්** ලබා ගත් අ.පො.ස (ස.පෙ) විභාග සහතිකය scan කර උඩුගත කරන්න

6.4 උප්පැන්න සහතිකය scan කර උඩුගත කරන්න .

**(ඉහත අංක 6.1 (i) හෝ (ii) අ,ආ, 6.3 හා 6.4 ට අදාළ, සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.)**

## 7. ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම් කිරීම.

7.1 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට www.ihra.cmb.ac.lk යන වෙබ් අඩවියට පිවිස එහි එන Latest News හෝ Academic Programs හි Apply Online Click කිරීමෙන් අනතුරුව අයදුම් කිරීම සිදු කළ යුතුය.

7.2 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික **(විභාග දෙපාර්තමේන්තුව නිකුත් කළ)** හා සේවා පළපුරුද්ද සනාථ කිරීමේ සහතිකවල මුල් පිටපත් scan කොට උඩුගත (PDF format only) කළ යුතුය. ඔබ විසින් මෙකී සහතිකවල මුල් පිටපත් සහ සහතික පිටපත් ආයතනය විසින් ඉල්ලූ විට ලබා දීමට වගබලා ගත යුතුය.

7.3 අයදුම්පත්‍රය සමග අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු. 2,000/- ගෙවිය යුතු අතර අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී එකී මුදල් නියමිත පරිදි බැංකුවට ගෙවූ රිසිට්පත scan කර උඩුගත කළ යුතුය. මෙහි මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේදී ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ. අයදුම්පත්‍ර ගාස්තු නොගෙවන අයදුම්කරුවන් විභාග ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබයි.

7.4 අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමේදී යම් ගැටලුවක් හෝ තාක්ෂණික දෝෂයක් මතු වන්නේ නම් 0112503393/0112581504 දුරකථන අංකයන් හට ඇමතුමක් ලබා දී (උදේ 09.00 සිට සවස 3.00 දක්වා) තම ගැටලුව යොමු කර අදාළ උපදෙස් ලබා ගත හැක.

7.5 Online අයදුම්පත්‍රයෙහි සම්පූර්ණ කරන ලද සියලුම තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව ඔබ පෞද්ගලිකව වගකිව යුතු අතර එම තොරතුරුවල අසත්‍ය හෝ සාවද්‍ය බව මත ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
මානව සම්පත් අභිවර්ධන ආයතනය
අංක. 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07